අනවසර තැන්පතු භාර ගැනීම / මුදල් ව්‍යාපාර කටයුතු - හානිය, නීතිය සහ වගකීම සම්බන්ධව දැනුවත් කිරීම.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ව්‍යාපාර පනතට පටහැනිව මහජන තැන්පතු භාරගනිමින් අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල නිරතවන පුද්ගලයන් සහ ආයතන සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු ලංකාවේ විවිධ ප්‍රදේශවල පැවැත්වීම, මහජනතාව දැනුම්වත් කිරීමේ ප්‍රචාරණයන් සිදු කිරීම, එම පුද්ගලයන් සහ ආයතන සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීම, එම පුද්ගලයන් සහ ආයතන සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම, එකී අනවසර මුදල් ව්‍යාපාර පිළිබඳ තොරතුරු මහජනතාව වෙත සන්නිවේදනය කිරීම ඇතුළුව මහජනතාවට සාධාරණයක් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ වෙනම විමර්ශන අංශයක් 2020 වසරේදී ස්ථාපිත කරනු ලැබ ඇත.

Tsunami Wave
Ocean Wave
Exposed Beach

11:05
87%
facebook
Sponsored
Invest කරන්න බයද?
විශ්වාසයක් නැද්ද?
ලංකාවේ බහුතරයක් මේ ප්‍රශ්න ද... See more
12%
ගිනි පොලියක් අපෙන්
අපි දෙන්නම්
වසර 10කට අධික කාලයක් අඛණ්ඩව ඔබ සමග
විශ්වාසවන්තව ගනුදෙනු කරන දිවයිනේ ප්‍රමුඛතම
ආයතනයක් වන

මහජනතාවගේ මුදල් තැන්පතු භාර ගැනීමට අවසර ඇත්තේ කාටද?

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

මහජනතාවගෙන් මුදල් තැන්පතු භාරගැනීම සහ එම මුදල් ණයට දීම සහ/හෝ ආයෝජනය කිරීම යන කටයුතු කරගෙන යෑම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත සහ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි විධිවිධානයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් ආයතන වෙත අවසර ලබා දී ඇත.

- බලපත්‍රලාභී වාණිජ බැංකු (Licensed Commercial Banks)
- බලපත්‍රලාභී විශේෂිත බැංකු (Licensed Specialized Banks)
- බලපත්‍රලාභී මුදල් සමාගම් (License Finance Companies)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

"තැන්පතුව" යනු

පනතේ 73(1) වගන්තියට අනුව "තැන්පතුව" යන්නෙන්,

ඉල්ලා සිටි විටෙක හෝ

ගෙවීම් කරන තැනැත්තා සහ ගෙවීම් භාරගන්නා තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තන් වෙනුවෙන් එකඟ වූ කාලයක දී හෝ අවස්ථානුගත කරුණු මත,

පොලියක් හෝ අධි මිලක් සහිතව හෝ රහිතව,

ආපසු ගෙවීමේ කොන්දේසි යටතේ ගෙවූ මුදල් ප්‍රමාණයක් අදහස් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

"මුදල් ව්‍යාපාර" යනු

පනතේ 74 වගන්තිය අනුව "මුදල් ව්‍යාපාර" යන්න අර්ථ නිරූපණය කර ඇත. ඒ අනුව "මුදල් ව්‍යාපාර" යන්නෙන්

තැන්පතු භාර ගැනීමේ ව්‍යාපාරය, <u>සහ</u>

(අ) මුදල් ණයට දීම; හෝ

(ආ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ආයෝජනය කිරීම හෝ;

(ඇ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ණයට දීම හෝ මුදල් ආයෝජනය කිරීම අදහස් වේ.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත



කෙසේනමුත්, මහජන තැන්පතු භාර ගැනීමකින් තොරව පෞද්ගලික මුදල් යොදාගනිමින් ණයදීමේ ව්‍යාපාරයක් පමණක් පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍ර ලබා ගැනීමක් අවශ්‍ය නොවේ.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

- පනතෙහි 2 වන වගන්තියට අනුව අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සහ තැන්පතු භාරගැනීම වරදක් බව දක්වා ඇත. ඒ අනුව;

  මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා මෙම පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තෙකු හෝ මෙම පනතෙහි 3 වන වගන්තිය ප්‍රකාරව මේ පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තෙකු හැර වෙනත් තැනැත්තෙකු විසින් මුදල් ව්‍යපාර පවත්වාගෙන යාම හෝ තැන්පතු භාරගැනීම නොකළ යුතුය.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

පනතෙහි 3 වන වගන්තිය යටතේ පහත සඳහන් ආයතනවලට මෙම පනතෙහි විධිවිධාන අදාල නොවේ.

- බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකු
- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිදහස් කර ඇති ආයතනයක් (මුදල් සමාගමක් හැර)

  උදා: Building Society ආදිය

- පළාත් සභාවක ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි වී ඇති සමූපකාර සමිති
- තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් මඟින් මෙම පනත අදාළ වීමෙන් නිදහස් කරනු ලැබූ ආයතනයක්

  උදා: සමෘධි, ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති ආයතන ආදිය

මහජනතාව රැවටෙනුයේ ඇයි?

- මුදල් තැන්පත් කිරීමට පෙර, බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම් විසින් පිරිනමනු ලබන <u>පොලී අනුපාත අභිබවා</u> මෙම අනවසර මූල්‍ය ආයතන සහ පුද්ගලයන් හට ඉතා <u>කෙටි කාල පරාසයක් තුළ ඉතා විශාල වශයෙන් පොලී/ප්‍රතිලාභ</u> ලබා දීමට හැකියාවක් පවතින්නේද සහ එම අනවසර මූල්‍ය ආයතන වෙත කවර ආකාරයක ආර්ථික ශක්‍යතාවයක් පවතීද යන්න මහජනතාව විසින් විශේෂයෙන් සොයා බැලිය යුතුමය. https://youtube.com/shorts/ocD4z0rRJXg?feature=share

මහජනතාව රැවටෙනුයේ ඇයි?

විවිධාකාර වූ <u>ණය ගිවිසුම් සහ ණය සාධන පත්‍ර</u> භාවිතා කරමින් ආයෝජන සැලසුම් ප්‍රවර්ධනය කිරීම, අතථ්‍ය මුදල් (Virtual Currency) භාවිතා කිරීම සහ වෙළෙඳ දැන්වීම් (Ad Click) නැරඹීම තුළින් මුදල් ඉපැයීමට හැකි බව පැවසීම වැනි ව්‍යාජ උපක්‍රම තුළින් අනවසර මුදල් ආයෝජනයන් සඳහා විවිධ පාර්ශ්වයන් විසින් මහජනතාව පොළඹවා ගනු ලබයි.





2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

- පනතේ 48(1) වගන්තිය අනුව, පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලය ලැබූ තැනැත්තෙකු හෝ මේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව නිදහස් කරන ලද යම් බැංකුවක් හෝ ආයතනයක් හැර, වෙනත් කිසිම තැනැත්තෙකු විසින්, කිසිම ක්‍රමයකින් හෝ කිසිම ආකාරයකින්, ඍජු හෝ වක්‍ර ලෙස තැන්පතු කැඳවීම සඳහා ප්‍රචාරණය කිරීම වරදක් වේ.

- පනතේ 10 වන වගන්තියේ (2) උප වගන්තිය අනුව මුදල් සමාගමක් හෝ 10 වන වගන්තියේ (6) වන උප වගන්තියේ සඳහන් වන ආයතනයක් හැර, වෙනත් තැනැත්තෙකු විසින් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා මිස "මුදල්", "මූල්‍යකරණය ", හෝ "මූල්‍ය" යන වචන තනිව හෝ වෙනත් වචන සමග එක්ව හෝ ඉන් සෑදුන යම් වචනයක් හෝ එහි යම් අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන යම් වචනයක් හෝ ඒ තැනැත්තාගේ නමේ හෝ විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ කොටසක් ලෙස භාවිතා කරනු නොලැබිය යුතුය.

දණ්ඩන

- පනතේ 56(1) වගන්තිය අනුව, 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොවැඩි වූ කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම සහ අධිකරණයේ අධීක්ෂණය යටතේ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ඒ තැනැත්තාගේ ඇති බැරකම් පියවීමට යටත් විය යුතු ය.



අනවසර මහජන තැන්පතු භාර ගැනීම/මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වීම මර්ධනය සාමූහික මෙහෙවරකි

- මහ බැංකුව
- බැංකු හා මූල්‍ය ආයතන
- පොලීසිය
- නීතිපති දෙපාර්තමේන්තුව
- දේශපාලන අධිකාරය
- රාජ්‍ය නිළධාරීන්
- ආගමික ආයතන
- අධිකරණ පද්ධතිය
- ජනමාධ්‍ය
- සාමාන්‍ය මහජනතාව



නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල දායකත්වය

- තම ප්‍රදේශයේ ව්‍යාප්ත වන මෙම ආකාරයේ යෝජනා ක්‍රම පිළිබඳව විමසිලිමත් වීම.
- විමර්ශන සහ වැටලීම්.
- යථා පරිදි අධිකරණයට කරුණු වාර්තා කිරීම හා වැඩිදුර විමර්ශනය සඳහා අවසර ලබා ගැනීම.
- අදාල නියාමන ආයතනයන්ට, මහ බැංකුවට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අපරාධ පරීක්ෂණ අංශය වෙත මූලික විමර්ශන තොරතුරු ලබාදීම.
- නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා යොමුකිරීම.
- ග්‍රාමීය මට්ටමින් මහජනතාව දැනුවත් කිරීම



ප්‍රාදේශීය ලේකම්ගේ සහ පොලීසියේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

මුදල් ව්‍යාපාර පනතේ 47 වන වගන්තියට අනුව ප්‍රාදේශීය ලේකම් විසින් සහ පොලීසිය විසින් තොරතුරු සැපයිය යුතුය

පොලීසියේ කාර්යභාරය

මුදල් ව්‍යාපාර පනතේ 42 (2) (අ) වන වගන්තියට අනුව පොලිස්පති විසින් හෝ පළාත් හෝ කොට්ඨාශ භාර නියෝජ්‍ය පොලිස්පති විසින් තොරතුරු සැපයිය යුතුය.

එවිට පොලිස් ස්ථානාධිපතිවරුන් එම විමර්ශන කඩිනමින් සිදු කර වාර්තා කළ යුතුය.

විමර්ශන වාර්තාවක ආකෘතිය.

පුරවැසි වගකීම

"නීත්‍යානුකූල බව යනු ඒ ඒ රටේ ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විසින් තීරණය කළ යුත්තකි. එහෙත් මෙවැනි ක්‍රම තුළින් මුදල් අහිමි වී යන බව වටහා ගැනීමට ඔබට උසාවියේ හෝ රජයේ සහාය අවශ්‍ය නොවේ. ප්‍රවර්ධකයන් එය නීත්‍යානුකූල බව කීවද, රජය ඔවුන්ට විරුද්ධව පියවර නොගත්තද, ඔබේ මුදල් නැති වී යන්නේය යන නියතය වෙනස් වන්නේ නැත. එම නිසා මොළය පාවිච්චි කර තමන්ගේ මුදල් පරිස්සම් කර ගැනීම සෑම පුරවැසියෙකුගේම වගකීමකි."

(Robert L.FitzPatrick මහතා 2005 ජූනි 02 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේදී පැවැත්වූ දේශනයකිනි.)

මහජනතාවගේ කාර්යභාරය කුමක්ද?

- අනවසර මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන හෝ පුද්ගලයන් වෙත මුදල් ආයෝජනය කිරීමේදී ආකර්ෂණීය පොලී අනුපාත ලබාදීම, බදු ගෙවීම් පැහැර හැරීම, මුදල් විශුද්ධිකරණය, ප්‍රකට ව්‍යාපාර නාමයන් වෙත යොමුවීම, පෞද්ගලික දැන හැඳුනුම්කම් සහ අනෙකුත් වරප්‍රසාද හිමි වන බවට මවාපෙන්වීම තුළ අභිංසක මහජනතාව රැවටීමට ලක්වේ. එබැවින්, අති විශාල ලාභ හා ආදායම් යෝජනා කරන ආයෝජන ක්‍රමවේද සහ ආයතන තදින් සැක කරන්න.

- අනවසර මුදල් ව්‍යාපාර හෝ පුද්ගලයන් පිළිබඳ තොරතුරු දැනගත් විගස 011-2477504 යන දුරකථන අංකය / dsnbfi@cbsl.lk හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරන්න. එම තොරතුරු ලබාදෙන පුද්ගලයන්ගේ සහ ඔවුන් විසින් ලබා දෙන එම තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බැඳී සිටී.

- එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය විමර්ශන කටයුතු සඳහා තොරතුරු ලබා දෙන ලෙස මහජනතාවගෙන් ඉල්ලුම් කරනු ලැබූ විට එම තොරතුරු කඩිනමින් ලබා දී, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත උපරිම සහායක් ලබා තුළින් ඉහත කී අනවසර මුදල් ව්‍යාපාර හා පුද්ගලයන් තවදුරටත් රට පුරා ව්‍යාප්ත වීම අවම වනු ඇත.

අනවසර මූල්‍ය ආයතන සහ පුද්ගලයන් වෙත මුදල් තැන්පත් කිරීමේ අවදානම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY

- ඉහළ පොලී අනුපාත, හිතවත්කම, ව්‍යාපාර ලියාපදිංචිය, සුපිරි කාර්යාල, ටික දෙනෙකුට ලැබුණු ප්‍රතිලාභ



නීතිමය කටයුතු, විදේශගත වීමේ සූදානම, ඉඩකඩම් ගේදොර යානවාහන මිලදී ගැනීම, සමහර අයට නොගෙවපු මුදල්, අනිත් අයට ගෙවපු පොලී මුදල්, නීතිමය තහනම් කිරීම්

අනවසර මූල්‍ය ආයතන සහ පුද්ගලයන් වෙත මුදල් තැන්පත් කිරීමේ අවදානම

- අනවසර මූල්‍ය ආයතනවල කටයුතු මහ බැංකුව විසින් තහනම් කළ විට තම තැන්පතු මුදල් ලබා ගැනීම තාවකාලිකව ඇණ හිටීමෙන් <u>මුදල් අපහසුතාවයන්ට</u> ලක් විය හැකිය.
- අනවසර මුදල් තැන්පතු ලබාගන්නා ආයතන සහ පුද්ගලයින් බොහෝ විට නීත්‍යානුකූල නොවන ව්‍යාපාරවල යෙදෙන බැවින් තැන්පතුකරුවන්ද ඒවාට දායක වීම තුළින් <u>අනවශ්‍ය නඩු කටයුතු</u>වලට පැටලීම.
- අනවසර මුදල් තැන්පතු ලබා ගත් පුද්ගලයින් මිය ගියහොත් හෝ විදේශ ගතවුවහොත් තම මුදල් ලබා ගැනීමට <u>විවිධ දුෂ්කරතාවලට</u> මුහුණ දීම.
- ඔබ වෙනත් ආයතනයකින් හෝ පුද්ගලයෙකුගෙන් මුදල් ණයට ලබාගෙන අනවසර තැන්පතුවල යෙදවීමෙන් <u>ණයගැතියකු බවට පත්වීමේ අවදානම</u>.
- High risk high profit

අනවසර මූල්‍ය ආයතන සහ පුද්ගලයන් විසින් තැන්පතු ලබා ගන්නා ආකාර

- පොරොන්දු නොට්ටු මත ණය ගැනීම
- ගිවිසුම් මත ණය ගැනීම
- ඇඩ් ක්ලික්
- කොටස් වෙළෙඳපල ආයෝජනයන්
- Profit sharing ආදිය

අනවසර මුදල් ව්‍යාපාරයක් ගැන මහ බැංකුවෙන් නිවේදනයක්
වැඩි විස්තර - http://ow.ly/HBUr50JWtMF

අනවසර මුදල් ව්‍යාපාරයක් ගැන මහ බැංකුවෙන් නිවේදනයක්

මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් පුයිවට් ලිමිටඩ්,
වීරසිංහගේ තාරක සදරුවන් වීරසිංහ
සහ
තුෂාරි බුද්ධිකා විජේනායක

ADA derana BUSINESS

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු
සහ
ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පීව 125740)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020.09.15 දින පැවැති මුදල් මණ්ඩල රැස්වීමේදී **"සමන් කැකුල", ඇඹිලව, දෙමටළුව, කුරුණෑගල** පදිංචි / පිහිටා ඇති අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු මහතා සහ ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් එකී පනතෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර සිදු කළ හෝ සිදු කරන බව හෝ තැන්පත් භාර ගත් හෝ භාරගන්නා බවට තීරණය කරන ලද අතර තැන්පත්කරුවන්ගේ සමස්ත තැන්පතු ආපසු ගෙවීම සඳහා කාලරාමුවක් සහිත සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස විධාන කරන ලදී. ඒ අනුව ඉදිරිපත් කරන ලද තැන්පතු ආපසු ගෙවීමේ සැලැස්ම පිළිගත නොහැකි මට්ටමක පැවති බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020.10.21 දින පැවැති මුදල් මණ්ඩල රැස්වීමේ දී ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලදී.

තවද, මුදල් මණ්ඩලයේ උපදෙස් මත මෙම නීති විරෝධී තැන්පතු ලබාගැනීම සම්බන්ධයෙන් මුදල් ව්‍යාපාර පනතෙහි ප්‍රතිපාදන යටතේ අපරාධ නඩු පැවරීම සඳහා ඉල්ලීමක් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2020.11.02 දින වාර්තාවක් යවන ලදී.

එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට කිසිදු ආකාරයකින් තැන්පතු හෝ මුදල් කැඳවීම සහ රැස්කිරීම, වත්කම් බැහැර කිරීම / අන්සතු කිරීම, යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට හෝ සම්බන්ධ ගණුදෙනුවකට ඇතුළුවීම තහනම් කරමින්, එවැනි කටයුතු ක්‍රියාවිරහිත කරමින් නිකුත් කරනු ලැබූ තහනම් නියෝගය කොළඹ මහාධිකරණය විසින් 2021.01.15 දින දක්වා දීර්ඝ කරන ලදී.

අධ්‍යක්ෂ
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන: 011-2477000, 011-2440330, 011-2330220 විද්‍යුත් ලිපිනය: dsnbfi@cbsl.lk වෙබ් අඩවිය: http://www.cbsl.gov.lk

ස්තූතියි!